# IV කාර්ය මණ්ඩල පුවත්

අධිපති, ඩී. ඩබ්ලිව්. රාජපතිරාන මහතා, ජාත්‍යන්තර, මුදල් මණ්ඩලයෙහි ලංකාවේ විකල්ප අධිපති වශයෙන්, ක්වාලාලම්පූර්හි පවත්වන ලද, පොදු රාජ්‍ය මණ්ඩලයේ මුදල් ඇමති වරුන්ගේ සාකච්ඡාවට සහභාගිවීම සඳහාද, ටෝකියෝ වෙහි පවත්වන ලද ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ ද, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ ද, ජාත්‍යන්තර මුදල් සමායතනයේ ද වාර්ෂික රැස්වීම්වලට සහභාගි වීම් වස්, ක්වාලාලම්පූර් සහ ටෝකියෝව බලා 1964 අගෝස්තු මස 31 වැනි දින ලංකාවෙන් පිටත්ව ගියේය. ලංකාව බලා ආපසු එන ගමනේ දී අධිපති තුමා ගරු මුදල් ඇමති, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතා සමග චීනයේ පීකිං නගරයට ගොස්, 1964 සැප්තැම්බර් 22 වැනි දින පෙරළා ලංකාවට සැපත් විය.

1964 ඔක්තෝබර් මාසයේ දී නවසීලන්තයේ වෙලින්ටන්හි දී පැවැත්වූ "සියැන්සා" අධිපතීන්ගේ හයවැනි සාකච්ඡා සම්මේලනයට අධිපති තුමා සහභාගි විය. 1964 ඔක්තෝබර් 29 වැනිද වෙලින්ටන් බලා පිටත් වූ එතුමා, 1964 නොවැම්බර් 10 වැනිද පෙරළා ලංකාවට සැපත් විය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් සේවයේ නියුක්තව සිටි නියෝජ්‍ය අධිපති ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා අරමුදලේ සිය සේවා කාලය සම්පූර්ණ කළේය. 1964 දෙසැම්බර් මස 21 වැනි දින යළිත් මහ බැංකුවේ සේවාව ඇරඹූ ඒ මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් නිල කැරිනි.

ඩී. සී. ගුණසේකර මහතා නියෝජ්‍ය අධිපති වශයෙන් පත් කැරිනි.

කරච්චියේ දී පවත්වන ලද පස්වැනි "සියැන්සා" මහ බැංකු පාඨමාලාවට, බාහිර විශේෂඥයකු වශයෙන් සහභාගිවීම පිණිස 1964 ජනවාරි 22 වැනි දින ලංකාවෙන් පිටත්ව ගිය ආචාර්ය ගාමිණී කොරයා මහතා 1964 පෙබරවාරි 1 වැනිද පෙරළා ලංකාවට පැමිණියේය. වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයට, ලංකා නියෝජිත පිරිසේ සාමාජිකයෙකු වශයෙන් සහභාගිවීම සඳහා 1964 මාර්තු 31 වැනිද ජිනීවා බලා පිටත්වූ ඒ මහතා 1964 ජූනි 18 වැනිද පෙරළා ලංකාවට සැපත් වූයේය. පොදු රාජ්‍ය මණ්ඩලීය මුදල් ඇමති වරුන් ගේ සම්මේලනය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ වාර්ෂික රැස්වීම් වලට සහභාගිවීම සඳහා ක්වාලාලම්පූර් හා ටෝකියෝ බලා 1964 අගෝස්තු මස 31 වැනිද පිටත්ව ගිය අධිපති තුමා සමග ආචාර්ය කොරයා මහතා ද පිටත්ව ගියේය. ඒ මහතා 1964 සැප්තැම්බර් 20 වැනිද පෙරළා ලංකාවට සැපත් වූයේය. නිව්යෝර්ක් හි පවත්වන ලද, වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන් ගේ සම්මේලනයේ දී මහ ලේකම් වරයා ගේ උපදේශකයකු වශයෙන් සේවය කිරීම සඳහා 1964 ඔක්තෝබර් 18 වැනිද ලංකාවෙන් පිටත්ව ගිය ආචාර්ය කොරයා මහතා 1964 දෙසැම්බර් 2 වැනිද පෙරළා දිවයිනට සැපත් වූයේය.

සමාලෝචනයට භාජන වූ වර්ෂය තුළ පහත සඳහන් නිලධාරීන්ගෙන් සමහරෙක් තාවකාලික ලෙස රජයේ සේවාවට දුන් අතර, සමහර දෙනෙක් රජයේ තාවකාලික සේවාවේ වැඩිදුරටත් නිරතව සිටියහ.

පී. එච්. සිරිවර්ධන මහතා — ජාතික ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ වශයෙන් වැඩිදුරටත් රජයේ සේවාවෙහි නිරත විය.

| | |
|---|---|
| ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න මහතා | — ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි සේවය සඳහා මුදා හරිනු ලැබ සිටිය, මොහු ලංකා ගමනා ගමන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වශයෙන් සේවය සඳහා 1964 අගෝස්තු 25 වැනිදා සිට මුදා හරින ලදී. |
| ආචාර්ය එම්. ආර්. පී. සල්ගාදු මහතා | — කෘෂිකර්ම, ආහාර හා සමුපකාර පිළිබඳ අමාත්‍යාංශයේ සේවාවේ යෙදී සිට, බැංකුවේ සේවාව සඳහා 1964 ජූලි 1 වැනිදා ආපසු පැමිණියේය. |
| පී. බී. කරඳවල මහතා | — තව දුරටත් මුදල් අමාත්‍යාංශයේ සේවාවෙහි නිරත විය. |
| ආචාර්ය ඩී. එම්. කන්නන්ගර මහතා | — අභ්‍යන්තර හා බාහිර වෙළෙඳම් හා සැපයීම් පිළිබඳ අමාත්‍යාංශයේ සේවාව සඳහා මුදා හරින ලදී. පසුව රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ වරයකු වශයෙන් ඔහු පත් කැරිනි. |

මීට පෙර මෙන්, මහ බැංකුවේ නිලධාරීහු ගණනාවක් ම රජය විසින් පත් කරනු ලැබූ නොයෙකුත් කමිටුවල සේවාව කිරීමෙහි නියුතු වූහ.

## බැංකු ගොඩනැගිල්ල

බැංකුව, රැජින වීදියේ ඉදිකළ සිය නව ගොඩනැගිල්ලට, 1964 දී ගෙවැදිනි. එතෙක් බැංකුව ස්ථාන හතරක පමණ පවත්වාගෙන ගියේ, ඉන් මහජනයාට අපහසුකම් හා කරදර විඳීමට සිදු විය. දැනට බැංකුවට මුදල් තැන්පත් කිරීම සඳහා බැංකුවේ ම සුරක්ෂිතාගාර බිම් ගෙවල් ඇත. මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග බැංකුවේ ලොකුම දෙපාර්තමේන්තු දෙක වන විනිමය පාලන දෙපාර්තමේන්තුව සහ සේවක අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුව එකම ගොඩනැගිල්ලේ පිහිටුවා ඇත.